# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2286/08 - 2022 ජුනි මස 27 වැනි සඳුදා - 2022.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (x) (බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කර ඇති සහ වර්තමානයේ අංක 278, හයිලෙවල් පාර, මහරගම යන ලිපිනයෙහි පිහිටා ඇති සමාගමක් වන ලංකා නිපෝන් බිස්ටෙක් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා මෙහි II වන උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති කෙටි යෙදුමට අනුරූපීව මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ දක්වා ඇති උපාධිය ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් ලංකා නිපෝන් බිස්ටෙක් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ආයතනය මේ නියමය මගින් පිළිගනු ලැබේ.

I වන උපලේඛනය

*කොන්දේසි*

1. (මෙහි මින් මතු ''ආයතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා නිපෝන් බිස්ටෙක් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ (ගෞරව) උපාධිය සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදාළ උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී :-

   (අ) විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ භෞතික විද්‍යාව විෂය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම,; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත්, එයට ඇඳුණු පාඨමාලාවක් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (3) එකවර ලබා තිබීම.

යන ඇතුළත් කර ගැනීමේ අවම සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. ආයතනය විසින්, මේ නියමය ප්‍රකාශයට පත් කළ දිනයේ සිට සෑම වසර පහකට (5) වරක් නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන විෂය ප්‍රතිසමාලෝචනයකට යටත්ව, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමිය යුතු ය.

3. ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට සම්බන්ධ උපාධි පාඨමාලාව අංක 278, හයිලෙවල් පාර, මහරගම, ශ්‍රී ලංකාව යන ස්ථානයේ දී පමණක් පැවැත්විය යුතු ය.

4. ආයතනය විසින්, මේ නියමය ප්‍රකාශයට පත් කළ දිනයේ සිට වසර පහක් (5) ඇතුළත, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගැනීමට අපේක්ෂා කරනු ලබන ආයතනය, ආයතනය නමින් ලියාපදිංචි ස්ථානයක ස්ථාපිත කිරීමේ සාක්ෂි නිශ්චිත බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

5. ආයතනය විසින්, යෝජිත කාලසීමාවක් ඇතුළත යෝජිත ආයෝජනය සමග අනුකූල වීම සඳහා, සමාගම වෙත කොන්දේසි නියම කළ, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත මගින් පිහිටුවන ලද (මෙහි මින් මතු "බීඕඅයි" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග පවතින ගිවිසුමට පරිපූරක ගිවිසුමකින් ඇතුළත් විය යුතු අතර, එලෙස නියම කරන ලද කොන්දේසි සමග සමාගමේ ආයෝජන ප්‍රවාහය, කාර්ය සාධනය සහ අනුකූලතා නියාමනය කිරීම සඳහා බීඕඅයි වෙත බලතල හිමි වේ.

II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) | බීඑස්සී ගෞරව (මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව) |

**ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත්,**
අධ්‍යාපන අමාත්‍ය.

2022 ජුනි මස 23 වැනි දින,
කොළඹ දී ය.

EOG 06 - 028

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.